# නේවාසික රෝගීන් සඳහා ප්‍රතිකාරකරන නියෝගයක් මත සිටින විට ඔබගේ අයිතිවාසිකම් පිළිබඳ තොරතුරු දැන්වීම

**මෙම පත්‍රිකාව තේරුම් ගැනීමට හෝ ප්‍රතිකාර සම්බන්ධයෙන් ඔබට උදව් අවශ්‍යවන්නේ නම් කරුණාකර ඕනෑම විටකදී කාර්‍යමණ්ඩලයෙන් විමසන්න.**

## නේවාසික රෝගීන් සඳහා ප්‍රතිකාරකරන නියෝගයක් යනු කුමක්ද?

නේවාසික රෝගීන් සඳහා ප්‍රතිකාරකරන නියෝගයක් යනු මානසික රෝගයකින් පෙළෙන අයෙකුට තම ප්‍රතිකාර සම්බන්ධයෙන් එකඟවීමට නොහැකි සහ එසේ කිරීම ආරක්ෂාකාරී නොවන විටකදී නීතියානුකූළ ආකාරයකින් එම ප්‍රතිකාර ලබාදීම වේ.

නේවාසික රෝගීන් සඳහා ප්‍රතිකාරකරන නියෝගයක් කරනු ලබන්නේ වෙනත් කිසිඳු ආකාරයකින් එම පුද්ගලයාට සුදුසු ප්‍රතිකාර ලබාදීමට නොහැකි වන අවස්ථාවකදී එකී ප්‍රතිකාර ලැබෙන්නේ යයි සහතික කරගනු පිණිස පමණි.

## නේවාසික රෝගීන් සඳහා ප්‍රතිකාරකරන නියෝගයක් මත සිටින්නේය යනුවෙන් තේරුම් යන්නේ කුමක්ද?

ඔබ නේවාසික රෝගීන් සඳහා ප්‍රතිකාරකරන නියෝගයක් මත සිටින්නේ නම් ඔබගේ මානසික රෝගීතාවය උදෙසා ප්‍රතිකාර මධ්‍යස්ථානයක සිටිමින් නියමිත ප්‍රතිකාර ලැබිය යුතුය.

ඔබට පරිපූර්ණවූ ප්‍රතිකර්ම මාළාවකට ප්‍රවේශය හිමිවන අතර ඒවා දෙනු ලබන්නේ ඒ අවස්ථාවේ ඇති හොඳම සාක්ෂි පඳනම් කරගෙන ඔබගේ මානසික රෝගයට වඩාත් ප්‍රතිඵළදායී වන ප්‍රතිකර්මයි. මේ ප්‍රතිකර්ම අතර සාබච්ඡා මාර්ගයෙන් දෙනු ලබන පිළියම්, බෙහෙත් සහ වෙනත් මැදිහත් වීම් ඇතුලත්වේ.

ප්‍රතිකර්ම දෙනු ලබන්නේ පුහුණු වෛද්‍ය වෘත්තිකයන් වන අතර ඒ අතරට වෛද්‍යවරුන්, හෙදියන්, වෘත්තීමය පිළියම්කරුවන්, සමාජසේවකයන් සහ මනෝවෛද්‍යවරුන් ඇතුලත්වේ. මෙම වෘත්තිකයන් ඔබ සමඟ ක්‍රියාකරමින් සුවසීම උදෙසා ඔබට උදව්වනු ඇත. ඔබට උදව්වන වෘත්තිකයන් සමඟ ඕනෑම වෙලාවක ඔබේ ප්‍රතිකාර සම්බන්ධයෙන් කථාකළ හැක.

## වයස අවුරුදු 16 න් පහළ දරුවන්

ඔබ වයස අවුරුදු 16 න් පහළ නම් ඔබේ දෙමාපිය හෝ භාරකරුට ඔබ වෙනුවෙන් අයිතිවාසිකම් සඳහා ක්‍රියා කළ හැක.

## නේවාසික රෝගීන් සඳහා ප්‍රතිකාරකරන නියෝගයක් මත සිටින විට මගේ අයතිවාසිකම් මොනවාද?

ඔබට හෝ ඔබේ උදව්කරුට (අදාල නම්) ඔබේ නියෝගයේ සහ අයිතිවාසිකම් පිළිබඳ ප්‍රකාශයේ පිටපතක් හැකි විගස ලබා දෙනු ඇත.

ප්‍රතිකාර කරනු ලබන කණ්ඩායම නියම කරන කාළය තුළ පරීක්ෂා කරනවිට හා ප්‍රතිකාර කරනවිට ඔබට උදව්කරුවකු ඔබේ වෛද්‍යවරයා හෝ ප්‍රතිකාර මධ්‍යස්ථානයේ දෙනු ලබන සීමාවකට යටත්ව ලග තබාගත හැක. උදව්කරු ලෙස භාරකරුවෙකු, වෛද්‍ය නිළධරුවෙකු, ඥාතියෙකු, සාත්තුසේවකයකු, මිතුරෙකු හෝ ස්වේඡ්චා සේවකයකු හෝ නීතීඥයකු විය හැක.

ඔබේ ප්‍රතිකාර සුවවීම උදෙසා මුල්කරගෙන හා බලාගැනීමේ සැලැස්මකට අනුව කෙරේ. ඔබ හෝ ඔබේ ආධාරකරුට (අදාල නම්) එකී සැලැස්ම සෑදීම හා සළකාබැලීම උදෙසා හැකි තරම් ප්‍රායෝගිකව සහභාගි වියහැක.

ඔබට ඉංග්‍රීසි කථා කිරීමට අපහසු නම් භාෂා පරිවර්තකයෙකුගේ සහය ලබාගත හැක.

ඔබට අවශ්‍ය නම් ඔබගේ රෝගය හා විකල්ප ප්‍රතිකාර සම්බන්ධයෙන් මනෝචිකිත්සකයකුගෙන් දෙවන මතයක් ලබාගත හැක.

ඔබ ප්‍රතිකාර මධ්‍යස්ථානයේ සිටින විටදී ආගන්තුකයන්ට ඔබව බැලීමට හැකි අතර පිටස්තර පුද්ගලයන් සමඟ කථාකිරීමටද හැක. එසේ කථාකිරීමේදී සාධාරණ පුද්ගලිකත්වයක් ඇතිමුත් කථාකිරීමට ආගන්තුකයන්ට හා පුද්ගලිකත්වයට යම් සීමා හා කොන්දේසි තිබිය හැක.උදා: පැමිනීමේ වේලාවන් යනාදී නියෝගයට අනුව වැඩ කිරීමට ඔබ බැදිසිටී. ඔබව ප්‍රතිකාර මධ්‍යස්ථානයට ඇතුලත්කිරීමට පෙර සේවකමණ්ඩලයෙන් ඉවත්වීම, අවසර නොමැතිව ප්‍රතිකාර ඹධ්‍යස්ථානයෙන් යෑම හෝ පෙනීනොසිටීම සඳහාවූ අවසරයට පසු නැවතනොපැමිනීම නියෝගය කඩකිරීමකි. සේවකමණ්ඩලය ඔබ නැවත පැමිණීම තහවුරුකරනු ලබයි.

ඔබේ ප්‍රතිකාර සම්බන්ධයෙන් සතුටු නොවන්නේ නම් ප්‍රතිකාර කණ්ඩායම සමග සාකඡ්චා කළ හැක. ප්‍රතිකාර වලින් ඔබ බලාපොරොත්තු වන පරිදි ඇතිවන සුවය පිළිබඳ සෑහීමකට පත් නොවන්නේ නම් ඒ සඳහා විධිමත් පැමිනිල්ලක් කළහැක. ඒ සඳහා දූරකථන අංක මෙම පත්‍රිකාවේ සඳහන්ව ඇත.

මේ නියෝගයට එරෙහිව ඔබේ නඩුව සළකා බැලීමට අභියාචනයක් භාරකාර මණ්ඩලයට කළහැක. එය ඔබ වෙනුවෙන් ඔබේ උදව්කරුට හෝ නීතීඥයාට කළහැක. තවද නියෝගය වෙනස් කරනලෙස අභියාචනය පවතිද්දී ඉල්ලීමක් ඔබට කළ හැක.

ඔබට අභියාචනයක් කිරීමට අවශ්‍ය විට එය පටන්ගන්නා ආකාරය පිළිබඳ තොරතුරු ප්‍රතිකාර කණ්ඩායමින් කරුණාකර අසන්න. අභියාචනය පවතිද්දී ඔබවෙනුවෙන් පෙනීසිටීම සඳහා ඔබම හෝ ඔබේ උදව්කරුට හෝ නීතීඥයකුට හෝ සෞඛ්‍ය හා වයස් ගතවීම සඳහා වූ දෙපාර්තමේන්තුවෙන් ගෙවීම කරනුලබන නීතීඥයකුට පෙනීසිටිය හැක.

ඔබ හෝ ඔබේ උදව්කරුට (අදාල නම්) භාරකාර මංඩලයෙන් දෙනු ලබන නියෝගයන් හෝ තීරණ වල පිටපත් ප්‍රායෝගිකව හැකි ඉක්මනින් ලබාගත හැක.

ඔබ පිළිබඳ තොරතරු රහසිගත වනමුත් නීතියෙන් හෙළිදරව් කිරීමට අවශ්‍යවන්නාවූ හෝ සේවාවක් සැපයීම සඳහා හෝ සුරක්ෂිතභාවය පවත්වාගෙන යාම සඳහා හෙළිදරව් කළහැක. තරදුරටත් මෙකී තොරතුරු ඔබේ සුබසිද්ධිය උදෙසා හා ප්‍රතිකාර කරන විට හා ඔබේ සුවයට සාධාරණ ලෙස අවශ්‍ය වන්නේ නම් වෙනත් ආයතන සමග හෝ ඥාතියකු සමග හෝ සාත්තුසේවකයකු හෝ මිතුරෙකු සමග බෙදා ගතහැක.

## නීති සහය

මානසික සෞඛ්‍ය ක්‍රියාවලිය තේරුම් ගැනීම සඳහා සමහරවිට ඔබට හෝ ඔබගේ පවුලේ අයට උපකාර අවශ්‍ය විය හැක.

### Peer Worker (සමසේ වැඩකරන්නා)

ප්‍රතිකාර මධ්‍යස්ථානයේ ඔබට සහය දීමට හැකි සමසේ වැඩකරන්නවුන් හෝ සම විශේෂඥයන් සිටිය හැක. කරුණාකර සේවක මන්ඩලයෙන් වැඩිදුර විස්තර විමසන්න. සාත්තුකරුවන්ට සහ පවුල්වලට උදව්කිරීමට සත්කාර පිළිබඳ උපදේශකයකුද සිටිය හැක.

### Community Visitor Scheme

**ප්‍රජාවට පැමිණීමේ වැඩ සටහන** ස්වාධීන ව්‍යවස්ථානුතුල ආයතනයක් වන අතර අනුමතකරන ලද පත්‍රිකාර මධ්‍යස්ථාන නිරීක්ෂණය කිරීමද එහි මානසික ප්‍රතිකාර සුවය ලබන්නවුන්ගේ අයිතිවාසිකම් සඳහා නීති සහයද ලබාදේ

දුරක: 08 7425 7802 ගාස්තු රහිත: 1800 606 302

### The Office of the Public Advocate

**පොදු නීතිවේදීන්ගේ කාර්යාලය** මානසික දුබලතාවය සහිත පුද්ගලයන්ට උපදෙස්දීම, සහයවීම සහ නීති සහය සඳහා වූ ස්වාධීන ආයතනයකි.

දුරක: 08 8342 8200 ගාස්තු රහිත: 1800 066 969

### The Disability Advocacy and Complaints Service of South Australia

**දකුණු ඔස්ට්‍රේලියාවේ විකලාංගභාවය සඳහාවූ නීතිඋපදෙස් හා පැමිණිලි සේවාව** රාජ්‍ය නොවන සංවිධානයක් වන අතර ඕනෑම විකලාංගභාවයකින් පෙලෙන්නන් සඳහා නීතිඋපදෙස් හා පැමිණිලි සඳහා සහය වේ.

දුරක: 08 8297 3500 ග්‍රාමීය ප්‍රදේශ සඳහා ගාස්තු රහිත: 1800 088 325

**MALSSA** රාජ්‍ය නොවන සංවිධානයක් වන අතර විශේෂයෙන් ඉංග්‍රීසි කථා කල නොහැකි සහ සංස්කෘතිමය සහ භාෂාමය වශයෙන් විවිධවූ පසුබිමක් ඇත්තවුන්ට මානසික සෞඛ්‍ය ක්‍රියාදාමය පිළිබඳව තම සේවාදායකයන්ට නීති සහය ලබාදේ.

දුරක: 08 8351 9500

## භාෂා සහය

**භාෂා සහ භාෂණ පරිවර්ථන මධ්‍යස්ථානය**
දුරක: 08 8226 1990 (දකුණු ඔස්ට්‍රේලියාව)

**භාෂා සහ භාෂණ පරිවර්ථන සේවාව**
දුරක: 131 450 (ජාතික)

**ජාතික ආදේශක සේවාව**
ඇසීමේ හා කථා කිරීමේ අපහසුතා ඇති පුද්ගලයින් සඳහා
දුරක: 133 677
ගාස්තු රහිත: 1800 555 677

## පැමිණිලි

**ප්‍රතිකාර මධ්‍යස්ථාන** වල විමසීම් හා පැමිණිලි වලට සහය වීමට නිළධාරීන් ඇත. කරුණාකර නිවැරදි පුද්ගලයා ඔබට මුණගැස්වීම සඳහා කාර්යමණ්ඩලයේ සහය පතන්න.

**ප්‍රධාන මනෝචිකිත්සකයා** සුරක්ෂිත හා කාර්යක්ෂම මානසික සෞඛ්‍ය සේවාවක් සඳහා සහතික වේ.
දුරක: 08 8226 1091

**සෞඛ්‍ය හා ප්‍රජා සේවාවන්ගේ පැමිණලි සඳහා වූ කොමසාරිස්** පැමිණිලි විසඳීම සඳහා උදව්වේ.
දුරක: 08 8226 8666
ගාස්තු රහිත: 1800 232 007

© Department of Health and Ageing, Government of South Australia. All rights reserved. Printed June 2012

Government of South Australia
SA Health

# අයිතිවාසිකම් පිළිබඳ ප්‍රකාශය

# Inpatient Treatment Orders

# (නේවාසික රෝගීන් සඳහා ප්‍රතිකාරකරන නියෝග)

ප්‍රධාන මනෝචිකිත්සක කාර්යාලය

**SINHALA**

Government of South Australia
SA Health